# ආමවාතික සන්ධි රෝගය සඳහා දේශීය චිකිත්සාවේ සඳහන් පත්තු, මැල්ලුම් හා ඒවායේ අඩංගු ඖෂධ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

මදුශානි ඒ. ඩී. පී.
බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය, නාවින්න.

**සංක්ෂිප්තය**

වර්තමානයේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සඳහා රෝගීන් බහුල ව යොමුවන රෝග අතරින් සන්ධි රෝග ප්‍රධාන වේ. ඒ අතරින් ආමවාත සන්ධි රෝගය වඩාත් ප්‍රචලිත ය. ආහාර රසය නිසි සේ නොපැසවා සැකසුණ අවස්ථාව ආම නම් වේ. ආම, වාත යන වචන දෙකේ සම්මිශ්‍රණයෙන් හට ගන්නා ආමවාත රෝගයේ දී ආමය, වාත දෝෂයත් සමග එකතුව කඵ දෝෂය ඇසුරු කරන විවිධ ස්ථාන අතරින් ප්‍රධාන ලෙස සන්ධි ආශ්‍රය කර ගනිමින් පසුකාලීන ව හෘදය ද ආශ්‍රය කර ගනිමින් තීව්‍ර ආමවාත රෝගය ඇති කරයි. මෙම රෝගය සඳහා ආයුර්වේද මෙන් ම දේශීය වෛද්‍ය ක්‍රමයේ ද බොහෝ චිකිත්සා පද්ධතීන් දැකගත හැකි වේ. එම බාහිර ප්‍රතිකාර ක්‍රම වර්තමානයේ වෛද්‍යවරුන් භාවිත නොකිරීම නිසා චිකිත්සීය අත්දැකීම් විරල වීම හේතුවෙන් ග්‍රන්ථවලට පමණක් සීමා වී ඇති බව ප්‍රධාන කරුණකි. මීට හේතුව ලෙස මෙම ප්‍රතිකාර ක්‍රම සකස් කරගැනීමේ අපහසුව, අමුද්‍රව්‍ය හිග වීම හා මෙම ප්‍රතිකාර ක්‍රම භාවිතයේ අපහසුව දැක්විය හැක. ඒ නිසා සාර්ථක බාහිර ප්‍රතිකාර ක්‍රම සොයා බැලීම කාලීන අවශ්‍යතාවකි. මේ නිසා මෙම සමීක්ෂණයේ අරමුණ වූයේ දේශීය වෛද්‍ය ග්‍රන්ථ භාවිත කරමින් ආමවාත සන්ධි රෝගය සඳහා බාහිර ව යෙදිය හැකි පත්තු මැල්ලුම් එක්රැස් කර එම ඖෂධවල ගුණ කර්ම විමර්ශනය කිරීම යි. මෙහි දී වාත, කඵ ප්‍රධාන ව ආමය දූෂණය වන අතර ධාතු ලෙස රස, රක්ත, මාංශ, ස්නායු සන්ධි දූෂ්‍ය වන අතර අධිෂ්ඨානය සන්ධි වේ. ආමවාතික සන්ධි රෝගය සඳහා වන දේශීය පත්තු, මැල්ලුම්වල අඩංගු වන ඖෂධවල රස අතුරින් තික්ත හා මධුර රස බහුල වීමත් අනුපිළිවෙළින් කටු, කෂාය, අම්ල රසත් දක්නට තිබූ අතර ලවණ රස දක්නට නොතිබුණි. වීර්ය සැලකූ විට 75% ක් උෂ්ණ වීර්ය දක්නට ලැබුණු අතර 25% ක් ශීත වීර්ය දක්නට ලැබුණි. විපාක අතරින් කටු විපාකය 60% ක් දක්නට ලැබුණු අතර 25% ක් මධුර විපාකය දක්නට ලැබුණි. 15% ප්‍රතිශතයක් අම්ල විපාකය තිබූ අතර එය ඉතා ම අඩුවෙන් භාවිත වුණි. ගුණ අතරින් ලඝු, රූක්ෂ, තීක්ෂ්ණ, ගුණ බහුල ව දක්නට ලැබුණි. බහුල ව භාවිත වූ ද්‍රව්‍ය ලෙස සාරණ, දේවදාර, ඉඟුරු, මුරුංගා, අබ, වරා, තල, එඬරු, ගම්මිරිස්, සියඹලා, නික දක්නට ලැබුණි. මින් පෙනී යන්නේ වාත කඵ දූෂිත ව හටගන්නා වූ ආමවාත රෝගය වාත කඵ ශාමක වන රස, ගුණ, වීර්ය, විපාක අඩංගු ඖෂධ අඩංගු පත්තු, මැල්ලුම් වඩා උපයෝගී වන බව යි.

**ප්‍රමුඛ පදඃ** ආමවාතය, දේශීය චිකිත්සාව

**විද්‍යුත් ලිපිනයඃ** pradeepamadu50@gmai.com